# පවනිගේ අඹ ගස



# හැඳින්වීම



මම මහ/මහාමායා බාලිකා විද්‍යාලයේ ඉගෙනුම ලබන ශිෂ්‍යාවකි. පාසලේ ගුරුවරුන්ගෙන් ලද දැනුම උපයෝගී කර ගනිමින් මාගේ දැනුම පරිදි මෙම කතන්දර පොත් ලිවෙමි. එම පොත් මාගේ දෙමාපියන් කියවා මෙම පොත ලියන ලෙස උපදෙස් දුන්හ. මා කුඩා කල සිටම ඇසූ කියවූ කදන්දරවලින් යම් යම් ආදර්ශ උපයෝගී කරගෙන මෙම කුඩා කතන්දර පොත සැදුවෙමි. මෙම පොත සෑදීමට මා හට බොහෝ උදව් උපකාර කළ මාගේ දෙමාපියන්, ගුරුවරුන් ඇතුළු සියළු දෙනාටමත් මා ස්තූතිවන්ත වෙමි.

මම

කේ. නිතුලි ගිහංසා ද සිල්වා
නො. 28,
ලේවැල්ල පාර,
මහනුවර.
071 6999 732

25.12.2024

# පවනිගේ අඹ ගස

කර්තෘ : කේ. නිතුලි ගිහංසා ද සිල්වා

ISBN : 978-624-208-421-3

කර්තෘ ප්‍රකාශනයකි.

සියලුම හිමිකම් කර්තෘ සතුය.

ප්‍රථම මුද්‍රණය

2025 පෙබරවාරි 08

කතාව හා චිත්‍ර

3 ශ්‍රේණිය D

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

# පිදුම

මා හට මෙම තත්වයට පැමිණීමට

හොද නරක කියාදුන් මාගේ ආදරණීය

දෙමාපියන් සහ ගුරුවරුන් හට

මෙම කුඩාපොත පහන් සිතින් පුද දෙමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණියුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළ ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **“හෙරණගත්කරණී”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින  මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර



එකෝමත් එක ගමක හරි කරුණාවන්ත ගැහැණු ළමයෙක් ජීවත් වුණා.

එයාගේ නම පවනි.

මෙයා හරිම ආසයි අඹ කන්න.



දවසක් පවනි එයාගෙ අම්මත් එක්ක පොලට ගියා. පොලේ වෙලෙන්දෙක් අඹ විකුණමින් ඉන්නවා පවනි දැක්කා.

"අනේ අම්මේ මට අඹ ගෙඩියක් අරන් දෙන්නකෝ."

පවනි අම්මාට කීවා.

අම්මා පවනිට ඉදුණු අඹ අරගෙන දුන්නා.



පවනි අම්මා අරන් දුන්න අඹ තනියම නොකා අම්මටයි, තාත්තටයි දීලා පවුලේ හැමෝම එක්ක බෙදා ගෙන කෑවා.

පවනිට හරි සතුටුයි.



“අම්මේ අඹ ගසක් පැල වෙන්නේ මේ අඹ ඇටයෙන්ද?”

පවනි අඹ ගෙඩිය කමින් අම්මාගෙන් ඇහුවා.

“ඔව් දුවේ” අම්මා පිලිතුරු දුන්නා.

පවනි අඹ ගෙඩිය කාලා අඹ ඇටය විසි නොකර ඒ අඹ ඇටය වත්ත කොනක පැල කලා.



පවනි අඹ පැලය බලන්න හැමදාම උදේම වත්තට ගියා.

අඹ පැලයට වතුර දාලා සාත්තු කලා.

පුංචි පැලය දවසින් දවස දලු දාලා ඉක්මනට ලොකු වුණා.



ටික කාලයක් යද්දී අඹ ගස ලොකු වෙලා අඹ ගෙඩි වලින් පිරිලා තිබුණා.

අඹ කන්න සත්තුත් පවනිගේ වත්තට එන්න පටන් ගත්තා.

ගිරව්, ලේන්නු ඒ මේ අත පනිමින් පියාඹමින් සිටියා.



පවනි එයාගේ තාත්තට කියලා මේ අඹ ගෙඩි ටික කඩා ගත්තා.

එයා ඒවා අරන් ගිහින් එයාගේ යහලුවන් එක්ක බෙදා ගත්තා.

“යාලුවනේ මෙහෙට එන්න මම ඔයාලට අඹ ගෙනාවා. මෙන්න ගන්න.”

“අනේ හරිම රසයි පවනි. ස්තූති ඔයාට.” යහලුවන් කීවා.



පවනි ඉතිරි අඹ ඔක්කොම ගෙදර තියා නොගෙනන අහල පහල ගෙවල් වලටත්, නෑදෑයන්ටත් බෙදා දෙන්න අම්මාගන් ඇහුවා.

"අම්මේ අපි මේ ඉතිරි අඹ නෑදෑයන්ටත් බෙදල දෙන්න යමුද?" පවනි අම්මාගෙන් ඇසුවා.

"හා දුවේ අපි යමු. ඔයා හරි හොද ළමයෙක්." අම්මා පවනිව අගයන්නට වුණා.



“අනේ දුවේ කොහෙන්ද? මේ අඹ හරිම සුවඳයි.”

“මේ මම වත්තේ හිටවපු අඹ ගහේ අඹ තමයි නැන්දේ.” පවනි කීවා.

“ඔයාට බොහොම ස්තූති දුවේ. ඔයා හරිම කරුණාවන්තයි.”

ඔවුන් පවනිට ස්තූති කලා.



අපිත් පවනි වගේම හැමෝම එක්ක සහයෝගයෙන් සමගියෙන් බෙදාහදාගෙන ජීවත් වෙන්න පුරුදු වෙමු.

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්